සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023

Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: .....

ශ්‍රී ලංකා ඉතිහාසය - I

කාලය පැය 01 යි

උපදෙස් :-
- මෙම කොටස ප්‍රශ්න 40කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇත. නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- කොටස් දෙකකට මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ

- 01 සිට 10 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

01. (1) මහාතිත්ථ (2) ගෝකණ්ණ (3) ගොඩවාය
(4) මඩකලපුව (5) දඹකොළ පටුන (.....)

02. (1) ඇරිස්ටෝටල් (2) බැල්දියෙස් (3) මෙගස්තිනීස්
(4) ප්ලිනී (5) ඔනෙසික්‍රිටස් (.....)

03. (1) වල්ලිපුරම් (2) පෙරිම්යන්කුලම (3) රජගල
(4) හැබැස්ස (5) තම්මැන්නාව (.....)

04. (1) අලිගල (2) පාහිංයගල (3) බටදොඹලෙන
(4) බෙලිලෙන (5) අලවල ලෙණ (.....)

05. (1) මල්වතුඔය (2) කලා ඔය (3) දැදුරු ඔය
(4) යාං ඔය (5) ගල් ඔය (.....)

06. (1) පුලහත්ථ (2) බාහිය (3) මහාරත්ථක
(4) පනයමාර (5) පිලියමාර (.....)

07. (1) රජරට (2) දක්ඛිණ දේශය (3) අටදහස් රට
(4) දොළොස්දහස් රට (5) පස්යොදුන් රට (.....)

08. (1) සුගලා (2) අනුලා (3) ලීලාවතී
(4) කල්‍යාණවතී (5) සීවළී (.....)

09. (1) පුංඛගාම (2) අනුරාධපුරය (3) පොළොන්නරුව
(4) කුරුණෑගල (5) දඹදෙණිය (.....)

10. (1) සද්ධර්මරත්නාවලිය (2) දිව්‍යදානය (3) පූජාවලිය
(4) කව්සිලුමිණ (5) සමන්තකූටවර්ණනාව (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන, ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. (1) මල්වතු ඔය - අනුරාධගාම
(2) කලා ඔය - උරුවෙලගාම
(3) කුඹුක්කන් ඔය - විජිතගාම
(4) ගල්ඔය - දීඝගාම
(5) කිරිඳිඔය - මහාගාම (.....)

12. (1) පණ්ඩුකාභය - පරමානන්ද ලිපිය
(2) උපරාජවරු - රජගල ලිපිය
(3) භාණ්ඩාගාරිකවරු- මිහින්තලා ලිපිය
(4) ගණකවරු - මහ ඇළගමුව ලිපිය
(5) සෙන්පතිවරු - වැල්එල්ලුගොඩකන්ද ලිපිය (.....)

13. (1) පණ්ඩුකාභය - ස්වර්ණපාලි
(2) වලගම්බා - සෝමාදේවී
(3) වසභ - අනුලා
(4) විජයබාහු - තිලෝක සුන්දරී
(5) නිශ්ශංකමල්ල - කල්‍යාණවතී (.....)

14. (1) වික්‍රමබාහු - රජරට
(2) මාණාභරණ - දක්ඛිණ දේශය
(3) කිත්සිරිමේඝ - දොළොස්දහස් රට
(4) ගජබාහු - වළබිරට
(5) සිරිවල්ලභ - අටදහස් රට (.....)

15. (1) සිඛවළඳ සහ සිඛවළඳ විනිස - භික්ෂූ විනය නීති මාලාවකි.
(2) දම්පියා අටුවා ගැටපදය - ධම්මපදට්ඨ කතාවට ලියන ලද අටුවාවකි
(3) සද්ධර්මරත්නාවලිය - වෛද්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථය
(4) පැරකුම්බා සිරිත - ප්‍රශස්ති කාව්‍යයකි.
(5) සමන්තපාසාදිතාව - අටුවා ග්‍රන්ථය (.....)

- **අංක 16 සිට 20 දක්වා X සහ Y තීරු යටතේ දී ඇති ප්‍රකාශන දක්වා ඇත්තේ නිවැරදි අනු පිළිවෙලට නොවේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර පහත සංයෝග අතරින් තෝරා එහි අංකය වරහන් තුල යොදන්න.**

		X		Y
16	(1)	රිබෙයිරෝ	A	එදා හෙළ දිව
	(2)	ක්වේරෝස්	B	ලංකාවේ පනස් වසක්
	(3)	බැල්දියෙස්	C	ලංකා ඉතිහාසය
	(4)	රොබට් නොක්ස්	D	ලංකාධිපත්‍ය
	(5)	මේජර් ඩේව්	E	ලංකා පුරාවෘත්තය

(1) ABCDE (2) BCDEA (3) CDEAB
(4) DBACE (5) EABCD (.....)

		X		Y
17.	(1)	වළගම්බා	A	මිගාර
	(2)	ධාතුසේන	B	රවිදේව
	(3)	IV මිහිඳු	C	ලංකාපුර
	(4)	I විජයබාහු	D	කපිසීස
	(5)	I පරාක්‍රමබාහු	E	සේන

(1) ADCEB (2) BCAED (3) CAEBD
(4) DAEBC (5) EBDAC (.....)

		X		Y
18.	(1)	දඹදෙණිය	A	V පරාක්‍රමබාහු
	(2)	යාපහුව	B	වන්නි විජයබාහු
	(3)	ගෝවින්දමලය	C	සංඛ සෙනෙවි
	(4)	මිණිපේ	D	බුවනෙකබාහු ආදිපාද
	(5)	දැදිගම	E	සුභ සෙන්පති

(1) ADBCE (2) BEDCA (3) CDABE
(4) DABCE (5) EABDC (.....)

		X		Y
19.	(1)	I විජයබාහු	A	තුලාභාර දාන දීම
	(2)	I පරාක්‍රමබාහු	B	කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත
	(3)	නිශ්ශංකමල්ල	C	බුරුම ආක්‍රමණය
	(4)	II පරාක්‍රමබාහු	D	යාපා පටුන ජය ගැනීම
	(5)	VI පරාක්‍රමබාහු	E	ශ්‍රී ලංකාවෙන් චෝලයන් පලවා හැරීම.

(1) ADEAB (2) BCDAE (3) CABDE
(4) DBCAE (5) ECABD (.....)

	X	Y
20.	(1) පහතරට තෙත් කලාපය	A බුන්දල
	(2) පහතරට වියළි කලාපය	B බණ්ඩාරවෙල
	(3) වෙරළාශ්‍රිත වාසස්ථාන	C අලවළ ලෙන
	(4) මධ්‍යම කඳුකරය	D හෝර්ටන් තැන්න
	(5) ඉහළ කඳුකර තණ බිම්	E බෙල්ලන් බැඳි පැලැස්ස

(1) AEBCD (2) BACDE (3) CEABD

(4) DCABE (5) EABDC (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21. මධ්‍යම කඳුකරය
    (1) වාරි ශිෂ්ටාචාරයේ අභිවෘද්ධියට පදනම සැකසීම.
    (2) සමස්ථ දිවයිනේ ම දේශපාලන ඒකාබද්ධතාවයක් ඇති කිරීමට නොහැකි වීම.
    (3) ආක්‍රමණික අවස්ථාවල දී ආරක්ෂක ස්ථානයක් ලෙස භාවිතා විය.
    (4) භූගෝලීය බෙදීම්වලට පාදක ස්ථානයක් විය.
    (5) නිදහස් අරගලවල මූලස්ථානයක් විය. (.....)

22. අලක්ඡේශ්වර පවුල
    (1) ගම්පොල යුගයේ රජවරු සමග සබඳතා පැවැත් වූ ප්‍රභූ පවුලකි.
    (2) ලංකාතිලක විහාරය ඉදිකරන ලද්දේ මොවුන් විසිනි.
    (3) ඉබන්බතූතා විසින් සුල්තාන් හෙවත් රජු ලෙස හඳුන්වා තිබෙයි.
    (4) චෙංහෝ සෙනෙවියා සමග මත භේද ඇති කර ගැනීම.
    (5) රයිගම පාලන මධ්‍යස්ථානය ලෙස පවත්වා ගැනීම. (.....)

23. ප්‍රාග් ඓතිහාසික යුගය,
    (1) විවිධ ජ්‍යාමිතික හැඩයන්ගෙන් යුතු ක්ෂුද්‍ර මෙවලම් භාවිතා කිරීම.
    (2) දඩයම් දිවිපෙවත ජීවන රටාවේ ප්‍රධාන ලක්ෂණය විය.
    (3) ජනාවාස ව්‍යාප්තියේ ස්වභාවය අනුව ආහාර රටාවේ වෙනස්කම් දක්නට ලැබීම.
    (4) විධිමත් සුසාන විධි භාවිතා කිරීමට කටයුතු කිරීම.
    (5) සංස්කෘතික ලක්ෂණ අනුව ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වීම (.....)

24. පොළොන්නරු රාජධානිය.
    (1) පරාක්‍රම පාණ්ඩ්‍ය රජු දවස මෙහි බිඳ වැටීම සිදු වේ.
    (2) මහා තිත්ථ වරාය ඉතාම වැදගත් වරායක් ලෙස ක්‍රියාත්මක වීම.
    (3) තඹ මස්ස කාසිය භාවිතා කිරීම.
    (4) වාරි කර්මාන්ත සම්බන්ධයෙන් සමුද්‍ර සංකල්පය භාවිතා වීම.
    (5) දන්ත ධාතු වේ ආරක්ෂාව සඳහා වේලයික්කාර භටයන් යෙදවීම. (.....)

25. අභයගිරිය
    (1) චීන සංචාරක පාහියන් භික්ෂුව නේවාසිකව මෙහි වැඩ සිටියහ.
    (2) වලගම්බා රජු විසින් කරවන ලද්දකි.
    (3) ථේරවාදී හා මහායාන ග්‍රන්ථ අභයගිරියෙහි හදාරනු ලැබීය.
    (4) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම මෙහි දී සිදු විය.
    (5) බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ සුප්‍රසිද්ධ මධ්‍යස්ථානයකි. (.....)

- අංක 26 සිට 30 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **A, B, C** හා **D** යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

A සහ **B** පමණක් නිවැරදි නම් ..... 1 ද,
B සහ **C** පමණක් නිවැරදි නම් ..... 2 ද,
C සහ **D** පමණක් නිවැරදි නම් ..... 3 ද,
A සහ **C** පමණක් නිවැරදි නම් ..... 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
A සහ **B** පමණක් නිවැරදි ය.	**B** සහ **C** පමණක් නිවැරදි ය.	**C** සහ **D** පමණක් නිවැරදි ය.	**A** සහ **C** පමණක් නිවැරදි ය.	ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය.

26. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
A අතීත ශ්‍රී ලංකාවේ ජල සම්පාදන ක්‍රම යටතේ වගා කටයුතු සිදු කරන ලදී.
B වැව් අමුණු ඉදිකිරීම හා අලුත්වැඩියා කටයුතු සිදු කරවීම රජුගේ වගකීමක් විය.
C ගංගා හෝ ඇළ මාර්ග හරස් කරමින් ගල්වැටි ඉදිකර ඇත.
D යෝධ ඇළ හෙවත් ජය ගඟ හෙළ වාරි ඉංජිනේරුවන්ගේ විශ්මිත නිර්මාණයකි. (.....)

27. ලංකාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහිලා මෙරට ගංගා පද්ධතිය බලපා ඇති ආකාරය සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
A දේශ සීමා ලෙස හා ප්‍රවාහන මාර්ග වශයෙන් ගංගා වැදගත් වෙයි.
B රට තුළට ජනතාවගේ පිවිසීම ගංගා මගින් අවහිර කොට ඇත.
C ජනාවාස ව්‍යාප්තියට මෙන් ම බිහිවීමට ගංගා මගින් යම් යම් බලපෑම් ඇති වීම දක්නට ලැබෙයි.
D වෙනම රටක් ලෙස වර්ධනය වීමට බලපෑ ප්‍රධානතම භූගෝලීය සාධකය ගංගා පද්ධතියයි. (.....)

28. ලංකා ඉතිහාසය හැදෑරීමට ඇති පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පිළිබඳව කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
A ක්‍රි. පූ. 3 සියවසේ සිට ලියන ලද පාලි, සංස්කෘත, සිංහල, දෙමළ සෙල්ලිපි මෙයට අයත් ය.
B මේවායේ සඳහන් ඓතිහාසික කරුණු වඩාත් විශ්වාසදායක ඒවා නොවේ.
C ගිරි ලිපි, ලෙන් ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි යනුවෙන් මේවා වර්ග කළ හැකිය.
D මෙරට සෙල්ලිපි වැඩිම සංඛ්‍යාවක් හිමි පාලකයා වසභ රජුය. (.....)

29. පණ්ඩුකාභය රජුගේ පාලන කාලය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
A අනුරාධපුරය අගනුවර බවට පත් කර ගැනීම.
B පණ්ඩුකාභය රජු විසින් ස්වර්ණපාලී කුමරිය විවාහ කර ගැනීම.
C පරිපාලන ප්‍රතිසංස්කරණයක් ලෙස ග්‍රාම සීමා පිහිටුවීම.
D නුවර වැව ඉදි කරමින් වාරි කර්මාන්තය නගා සිටුවීමට කටයුතු කිරීම. (.....)

30. සීතාවක රාජධානියේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේද ?
A මායාදුන්න රජු ශිව ආගම වැළඳගැනීම.
B සීතාවක රාජධානියට අයත් ප්‍රදේශ ලන්දේසීන් විසින් අල්ලා ගැනීම.
C I රාජසිංහ රජුගේ කාර්යය සාඵලය ශක්තිමත් ලෙස ඉදිරියට ගෙන යා හැකි අනුප්‍රාප්තිකයෙකු නොමැති වීම.
D මහනුවර කේන්ද්‍ර කොටගෙන I වන විමලධර්මසූරිය රජුගේ නැගීම (.....)

- **31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. මහින්දාගමනය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි සෙල්ලිපියක් පිහිටා ඇති ස්ථානයකි,
(1) රජගල (2) සිතුල්පව්ව (3) වේවැල්කැටිය
(4) තෝනිගල (5) ගඩලාදෙනිය (.....)

32. ක්‍රි. පූ. 1800 දී පමණ සිට ශාකමය වගාව, මැටිවළං භාවිතය, පරිභෝජනය පිළිබඳ සාධන හමුවන ස්ථානයක් වන්නේ,
(1) දොරවක (2) යටිගල්පොත්ත (3) ඉබ්බන්කටුව
(4) උඩමළුල (5) බූන්දල (.....)

33. වැව් බැම්ම අරක්ෂා කර ගැනීම සඳහා පැරැන්නන් විසින් ඉදිකල වාරි අංගය වන්නේ,
(1) පිටවාන (2) රළපනාව (3) බිසෝකොටුව
(4) අතුළුවාන (5) සොරොව්ව (.....)

34. විනය පිටකයට ලියන ලද අට්ඨකතාව ලෙස සැලකෙන්නේ,
(1) උත්තර විහාරට්ඨකතාව (2) සීහළට්ඨකතාව (3) සමන්තපාසාදිකාව
(4) විනයට්ඨකතාව (5) සාරාර්ථදීපනී (.....)

35. පැරණි ශ්‍රී ලංකාවේ පැවති බෞද්ධාගමික අධ්‍යාපන මධ්‍යස්ථානයක් නොවනේ,
(1) සිතුල්පව්ව (2) අභයගිරිය (3) ජේතවනාරාමය
(4) තිස්සමහාරාමය (5) මහාවිහාරය (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

ප්‍රතිචාරය	පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
(1)	නිවැරදිය.	වැරදිය.
(2)	නිවැරදිය.	නිවැරදිය.
(3)	වැරදිය.	වැරදිය.
(4)	වැරදිය.	නිවැරදිය.
(5)	නිවැරදිය.	නිවැරදි වන අතර පළමුවැන්න මැනැවින් පහදා දෙයි.

	පළමුවන ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
36	දඹදෙණියේ විජේසුන්දරරාමය III විජයබාහු විසින් කරන ලද්දකි.	චෝඩංගගේ ආක්‍රමණය යාපහුව රාජ්‍ය සමයේ මෙරට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණයකි. (.....)
37	තීය බමුණාගේ කැරැල්ල ඇති වූයේ වලගම්බා රජුගේ කාලයේ දී ය.	නිශ්ශංකමල්ල රජුට අයත් ගල්විහාර පුවරු ලිපිය මෙරට දීර්ඝතම ශිලා ලිපියයි. (.....)
38	දොළොස්වන රජ වර්ෂයේ දී පණ්ඩුකාභය විසින් දිවයිනේ ග්‍රාම සීම ලකුණු කරන ලදී.	V මිහිඳු සිරභාරයට ගනිමින් එල්ල වූ කාලිංග මාඝ ආක්‍රමණය හේතුවෙන් පොළොන්නරු රාජධානිය බිඳ වැටීම සිදුවිය. (.....)
39	නිශ්ශංක අලගක්කෝනාර විසින් කෝට්ටේ බලකොටුව ඉදිකරන ලදී.	ප්‍රමාණාත්මක පරිදි ආහාර තොග ගබඩා කර ගනිමින් ආර්ය චක්‍රවර්තීන්ගේ බඳු නිලධාරීන් පලවා හැරීමට ඔහු සමත් වූ බව රාජවලියේ සඳහන් වේ. (.....)
40	ක්‍රි. ව. 1227 දී iv පරාක්‍රමබාහු රජු විසින් කුරුණෑගල රාජධානිය ආරම්භ කරන ලදී.	ගම්පොල යුගයේ දී මෙරටට එල්ල වූ චීන ආක්‍රමණය පිළිබඳ ත්‍රිභාෂා සෙල්ලිපියේ තොරතුරු අනාවරණය කරයි. (.....)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023

Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: .....

ශ්‍රී ලංකා ඉතිහාසය - II

කාලය පැය 02 යි

උපදෙස්:-

අමතර කියවීම් කාලය විනාඩි 10 යි

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ, පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
- **B කොටසින් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.**

A කොටස

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) පාහියන්ගල	(ii) දඹදෙණිය	(iii) ගොඩවාය
(iv) හුරුළු වැව	(v) කිරිදි ඔය	(vi) මිනිහාගල්කන්ද
(vii) පඬුවස්නුවර	(viii) සබරගමුව පළාත	(ix) මහියංගනය
(x) ලංකා පටුන	(xi) ගම්පොළ	(xii) කයිට්ස්

B කොටස

02. ඓතිහාසික මූලාශයයක් ලෙස මහාවංශය වැදගත්වන ආකාරය,
(i) විශ්වාසනීය මූලාශ්‍රයයක් ලෙස වැදගත් වීම.
(ii) අඛණ්ඩ ඉතිහාසයක් අනාවරණය කිරීම.
යන ශීර්ෂ යටතේ නිදසුන් හතරක්වත් දක්වමින් සනාථ කරන්න. (ලකුණු 16)

03. (i) මුල් ආර්ය ජනාවාස ව්‍යාප්ත වූ ගංගා නිම්න 03 ක් නම් කරන්න. (ලකුණු 03)
(ii) ඉන්දියාවට ආසන්නයේ ශ්‍රී ලංකාව පිහිටී ම මෙරට ඉතිහාසය හැඩගැසීම සඳහා දේශපාලනික වශයෙන් බලපෑ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)
(iii) අභ්‍යන්තර භූගෝලීය සාධක ලෙස වරාය පද්ධතියේ දායකත්වය මෙරට ඉතිහාසයට බලපෑ ආකාරය නිදසුන් හතරක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 07)

04. පහත ශීර්ෂ ඇසුරින් ඓතිහාසික යුගය පිළිබඳව පැහැදිලි කරන්න.
(i) ජනාවාස වීම.
(ii) ජීවන රටාව (ලකුණු 16)

05. ''පණ්ඩුකාභය රාජ්‍ය සමය ලංකා ඉතිහාසයේ වැදගත් කාලවකවානුවකී''
(i) පණ්ඩුකාභය රජු ඉදිකළ වාපි කර්මාන්ත 03 ක් නම් කරන්න. (ලකුණු 03)
(ii) ශ්‍රී ලංකාවේ ප්‍රථම අගනගරය ලෙස අනුරාධපුර නගරය ගොඩනැගීමේ දී මෙතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න. (ලකුණු 06)
(iii) පණ්ඩුකාභය රජ සමයේ මෙරට පැවති ආගමික විශ්වාස පිළිබඳව විචාරාත්මකව විමසන්න. (ලකුණු 07)

06. ''මෙරට සංස්කෘතික අභිවෘද්ධියේ ප්‍රභල සංධිස්ථානයක් ලෙස, දේවානම්පියතිස්ස රජ සමය වැදගත් වේ.'' නිදසුන් හතරක්වත් ඇසුරින් මෙම ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 16)

07. රජරට ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්තය පිළිබඳව පහත සඳහන් මාතෘකා යටතේ විවරණයක් කරන්න.
(i) රජුගේ අනුග්‍රහය
(ii) වාරි තාක්ෂණය (ලකුණු 16)

08. ''පළමුවන විජයබාහු රජු ශ්‍රේෂ්ඨ පාලකයෙකි.'' රට එක්සේසත් කිරීමේ ක්‍රියාදාමය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 16)

09. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
1. ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ
2. දෙවන පරාක්‍රමබාහු රජතුමා
3. ගම්පොල යුගයේ ගෘහනිර්මාණ ශිල්පය.
4. කෝට්ටේ යුගයේ සාහිත්‍යය.
(එක් කොටසකට ලකුණු 08 බැගිනි)

(01) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම